රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION, LOCAL GOVERNMENT AND DEMOCRATIC GOVERNANCE

ඒකාබද්ධ සේවා අංශය     இணைந்த சேவைகள் பிரிவு     COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතන<br>தொலைபேசி: (94) 011- 2694560<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்: (94) 011- 2692254<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்: dgcs@pubad.gov.lk<br>E-mail | වෙබ් අඩවිය<br>இணைத்தளம்: www.pubad.gov.lk<br>Web Site |
|---|---|---|---|

| මගේ අංකය / எனது இல / My No | PA/CS/POLICY/වා.ස්.මා.2015 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2015.05.19 |
|---|---|---|---|---|---|

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**2015 වාර්ෂික ස්ථාන මාරුවීම් - ( ඒකාබද්ධ සේවය) රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය,ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, කාර්යාල සේවක සේවය, ඒකාබද්ධ රියදුරු සේවය.**

ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු යෝජනා ඔබ වෙත දැන්වූ මගේ සමාංක හා 2014.10.14 දිනැති ලිපියට සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ අනුව වූ සංශෝධනයන්ට යටත්ව වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කරන ලද මගේ සමාංක හා 2014.11.27 දිනැති ලිපියට කාරුණික අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මගින් සංශෝධනය / අවලංගු වූ හෝ ඉදිරි දිනයක ක්‍රියාත්මක විය යුතුව ඇති ස්ථාන මාරුවීම් හැර 2015 වාර්ෂික ස්ථාන මාරු නියෝගයන්හි සඳහන් ඉතිරි සියළුම ස්ථාන මාරු නියෝගයන් මේ වන විට ක්‍රියාත්මකව තිබිය යුතුය.

03. එබැවින් අංක:02/2014 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව වාර්ෂික ස්ථාන මාරු නිසි පරිදි ක්‍රියාත්මක කෙරෙන බවට වග බලාගත යුතු හෙයින් එම චක්‍රලේඛයේ 8 වගන්තියේ සඳහන් පරිදි, වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග මගින් අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන්ට නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට නොහැකිවන සේ අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා ගෙන සිටින සහ අනුප්‍රාප්තිකයන් පැමිණියේ වුව ද අදාළ නිලධරයන් මුදා නොහැර සිටින සියළුම ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් එවන ලෙස එහි ලේකම් මා වෙත දන්වා ඇත.

04. ඒ අනුව 2015 වාර්ෂික ස්ථාන මාරු ලද නමුත් 2015.05.08 දින වන විට ද ඔබ අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන්/ ආයතනයෙන් මුදා හැර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පහත දැක්වෙන ආකෘතියට අනුව සකස් කළ වාර්තාවක් 2015.05.29 දිනට පෙර මා වෙත එවන ලෙස කාරුණිකව දන්වමි.

| වාර්ෂික ස්ථාන මාරු නියෝගයේ ඇති අනු අංකය | නිලධරයාගේ නම සහ සේවක අංකය | අයත් සේවය සහ පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු කළ සේවා ස්ථානය | අභියාචනා කළේ ද යන්න හා එහි තීරණය හා අනු අංකය | | අනුප්‍රාප්තිකයා පැමිණියේ නම් එම නිලධරයාගේ නම | නිලධරයා මුදා නොහැරීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සමාලෝචන කමිටුව | රා.සේ.කො. | | |
| | | | | | | | | |

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.